ගැත්තා පතන පාපක්ෂමාව ඔහුගේ ගෙල හිර නොවන තාක් කල් සර්වබලධාරී කීර්තිමත් අල්ලාහ් පිළිගන්නේය.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා ප්රකාශ කළ බවට අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) විසින් වාර්තා කරන ලදී. “ගැත්තා පතන පාපක්ෂමාව ඔහුගේ ගෙල හිර නොවන තාක් කල් සර්වබලධාරී කීර්තිමත් අල්ලාහ් පිළිගන්නේය.”
[හසන් ගණයට අයත් හදීසයකි] [ඉබ්නු මාජාහ් එය වාර්තා කර ඇත - ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත - අහ්මද් එය වාර්තා කර ඇත]

ප්රාණය උගුර දණ්ඩ දක්වා ළඟා නොවන තාක් කල් ගැත්තාගේ පාපක්ෂමාව සර්වබලධාරී අල්ලාහ් පිළිගන්නේය. ප්රාණය උගුර දණ්ඩ දක්වා ළඟා වූ විට ඔහුට පාපක්ෂමාව හිමි වන්නේ නැත. උත්තරීතර අල්ලාහ් ඒ ගැන මේසේ පවසා ඇත. “ඔවුන් අතරින් කිසිවෙකු වෙත මරණය පැමිණ ‘සැබැවින්ම මම දැන් පාපක්ෂමාව ඇයැද සිටිමි යැයි පවසන තෙක් නපුරුකම් සිදු කරන්නන් හට පාපක්ෂාව නැත.” (අන් නිසා: 18)

https://sunnah.global/hadeeth/si/show/4315